…1987
අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 14 දරන
# ගුවන් සංතරණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 අප්‍රේල් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල: ශත 45 යි    තැපැල් ගාස්තුව: ශත 75 යි.

# 1987 අංක 14 දරන ගුවන් සංතරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 50/83

**ගුවන් සංතරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1987 අංක 14 දරන ගුවන් සංතරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1982 අංක 2 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනතින් ඇතුළත් කරන ලද) ගුවන් සංතරණ පනතේ 21අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 365 වන අධිකාරයේ 21අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (17) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'(17අ) (අ) මේ උපවගන්තිය අදාළ වන තැනැත්තකු අනුයෝජිතයාගේ කාර්ය මණ්ඩලයේ තනතුරකට, එම අනුයෝජිතයා පත් කෙරෙන (1) වන උපවගන්තිය යටතේ වූ නියමයේ දිනයට පසුව නොවූ දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබ, අදාළ සේවා කාලයට නොඅඩු සේවා කාලයක් එම තනතුරේ ඔහු සේවය කරන අවස්ථාවක, එම තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශිත රජයේ සේවයේ තනතුරක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම තැනැත්තා විසින් අනුයෝජිතයා යටතේ අදාළ කාල පරිච්ඡේදය සඳහා කලින් කරන ලද සේවය රජය යටතේ කරන ලද සේවය ලෙස එම ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(ආ) මේ උපවගන්තිය අදාළ වන තැනැත්තකු, අදාළ සේවා කාලය අවසානයේදී ධුරය අහෝසි කිරීමේ හේතුව මත අදාළ සේවා කාලය අවසානයේදී ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගත්තේ නම් ඔහුට ප්‍රදානය කළ හැකිව තිබූ විශ්‍රාම වැටුපට සමාන මුදලක විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(ඇ) "මේ උපවගන්තිය අදාළ වන තැනැත්තකු" යන්නෙන්—

(i) අනුයෝජිතයාගේ කාර්ය මණ්ඩලයේ තනතුරකට ස්වකීය පත්වීම ලබන්නට පෙරාතුවම සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ රජයේ සේවකයකු වශයෙන් අවුරුදු දහයකට අඩු වූ ද අවුරුදු අටකට නොඅඩු වූ ද විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඇත්තා වූ ද එම දෙපාර්තමේන්තුවේ ඔහුගේ තනතුර (16) වන උපවගන්තිය යටතේ අහෝසි කරනු ලැබුවා වූ ද තැනැත්තකු ; හෝ

2—ඒ095390—7,225 (87/02)

(ii) අනුයෝජිතගෙ කාර්ය මණ්ඩලයේ තනතුරකට ස්ථිරය පත්වීම ලබන්නට පෙරාතුවම, 1979 අංක 46 දරන ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය පනතේ 31(2) (අ) වගන් තියේ සඳහන් මනාපය ඔහු විසින් ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන්, එම පනත මගින් විසිවුවන ලද ශ්‍රී ලංකා ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරියේ සේවයේ සේවා නියුක්තයකුව සිටියා වූ ද රජයේ සේවයේ අවුරුදු දහය කට අඩු සහ අවුරුදු අටකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඇති හෝ ඇතැයි සලකනු ලබන්නා වූ ද තැනැත්තකු

අදහස් වේ.

"අදාළ සේවා කාලය" යන්න මේ උපවගන්තිය අදාළ වන තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, එම තැනැත්තා අනුයෝජිතගේ කාර්ය මණ්ඩලයේ තනතුරකට පත්වීම ලැබූ දිනයෙන් පසුව රජයේ සේවයේම රැඳී සිටියේ නම්, රජයේ සේවයේ දස අවුරුදු විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය සම්පූර්ණ කිරීමට ඔහු සේවය කළ යුතුව තිබූ කාලය අදහස් වේ.';

(2) එම වගන්තියේ (19) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(16) වන සහ (17) වන උපවගන්ති අදාළ වන රජයේ නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකු" යන වචන වෙනුවට "යම් රජයේ නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන්.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.